# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013-12-31

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නගර සභා මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2014 වර්ෂය සඳහා අයවැය වාර්තාවක් සම්පාදනය ඉදිරිපත් කළ බවත්, 1991 වර්ෂයේ සිට පසුගිය වර්ෂය වන තෙක් කිසිදු බලපෑමකින් තොරව අයවැය සම්මත කිරීමේ බලයක් සභාවට තිබූ බවත්, පසුගිය වර්ෂයේ හඳුන්වාදුන් කොට්ඨාස ක්‍රමයට මැතිවරණ පැවැත්වීමේ ක්‍රමය යටතේ වසර දෙකක් ගත වූ පසු පළමුවර හා දෙවනවර ඡන්ද විමසීම් වලින් අයවැය පරාජයට පත් වුවහොත්, සභාපතිවරයාගේ සභාපති ධූරය අහෝසි වන පරිදි වෙනස් වී ඇති බැවින් පළාත් පාලන ආයතන කිහිපයක අර්බුදකාරී තත්ත්වයන් ඇති වුව ද, මෙම නගර සභාවේ අයවැය සාර්ථක ලෙස සම්මත කර ගැනීමට හැකියාව ලැබුණු බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය වර්ෂයේ දී නගරවාසී ජනතාවට දැනෙන විශාල සංවර්ධනයක් සිදු කිරීමට මෙම සභාවට හැකි වූ බවත්, මෙවර අයවැය යටතේ ද එක් එක් නගර සභා ගරු මන්ත්‍රීවරයකුට රු. 250,000.00 බැගින් ප්‍රතිපාදන වෙන් කිරීමට හැකි වූ බවත් එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. සභාවට

ලැබෙන ආදායමෙන් රු. ලක්ෂ 36ක මුදලක් වෙන් කර ඇති බව ද, එමෙන්ම පළාත් සභාවෙන් සහ රජයෙන් ලැබෙන ප්‍රතිපාදනයන් වෙතින් මෙන්ම ජාත්‍යන්තර සංවිධානයන් වෙතින් ද සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලැබෙනු ඇති බවට ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

අයවැය සකස් කිරීමේ දී සියලු නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් යෝජනා ඉල්ලා සිටිය ද, විපක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා කිසිදු යොජනාවක් ඉදිරිපත් කර නොමැති බව කණගාටුවෙන් ප්‍රකාශකරන බව දක්වන ලද අතර, එබැවින් ඔවුන් වෙත ලබන වර්ෂය සඳහා මුදල් වෙන් කිරීමක් සිදු නොවන බව ද, අයවැය ලේඛනයේ සඳහන් ආකාරයටම සියලු කටයුතු 2014 වර්ෂයේ දී සිදු කිරීමට බලාපොරොත්තු වන බව ද සඳහන් කරන ලදී. නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවන් මහා සභාවට ඉදිරිපත් කර එහි දී තීරණ ගෙන ඒ සම්බන්ධව කටයුතු කිරීමට අදහස් කරන බව ද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ත්‍රෛමාසික ''අරුණලු'' සඟරාව මෙවර ද සාර්ථකව ඉදිරිපත් කර ඇති බව ද, නගර සභාවේ නිලධාරීන්ගේ රාජකාරි ලැයිස්තුවක් ද ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දී ඇති බව ද, එමගින් යම් රාජකාරියක් සිදු කර ගැනීමේ දී එයට අදාල නිලධාරියා පහසුවෙන් සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබෙන බව ද ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී.

ඉදිරි වර්ෂයක පමණ ධූරකාලයේ දී සියලු කටයුතු නීත්‍යානුකූලව සහ සාර්ථකව සිදුකිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද අතර, ජනතාව විසින් ගෙවනු ලබන බදු මුදලට වඩා වැඩි සංවර්ධනයක් සිදු කිරීමට කටයුතු කරන බව ද, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා සහ කාර්යාලයේ සියලුම දෙනා හට නගර සභා ආඥා පනත, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, සභා රීති ආදිය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සිදු කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව ද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභාවේ ගරු සභාපතිතුමන්ගේ යෝජනාවක් වශයෙන් සම්මත වූ, මෙම සභාවට අයත් වෑන් රථය කුලී රථයක් වශයෙන් යෙදවීම සම්බන්ධව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් නැවත විමසන ලදී.

එයට පිළිතුරු දෙමින්,

***ගරු සභාපතිතුමා***

*වාහන නිකම් තබාගෙන හිඳීමේ තේරුමක් නෑ. මේ තීරණය ගත්තත් වර්තමානයේ බොහෝ වාහන ඇතත්, ඇතැම් මාස වල මේ වාහනය කිසිවකුත් කුලී රථයක් වශයෙන් යොදා නොගන්නට ද ඉඩ තිබෙනවා. තානායම් සම්බන්ධ ප්‍රචාරයන් සිදු කිරීමේ දී ඒවාට අදාල ප්‍රවාහන පහසුකම් සම්බන්ධව ද දක්වනවා. මෙය අත්හදා බැලීම සුදුසුයි.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*වෑන් රථය කුළියට ලබා දුන්නාට කමක් නෑ. නගර සභාවට පැමිණ අදාල විස්තර ලබා දී එය ලබා ගැනීමට හැකි විය යුතුයි. එහි නගර සභාවේ නම සටහන් කළ යුතුයි. ඒ සඳහා වගකිව යුතු රියදුරු මහතකු යෙදවිය යුතුයි. ගමන අවසන් කළ පසු දෛනික වාර්තා ලබා ගත යුතුයි. එසේ සිදු කළ පසු ගැටලුවක් ඇති වන්නේ නෑ.*

***ගරු සභාපතිතුමා***

*මිල කමිටු වාර්තාවලට අනුව වෑන් රථවල අය කරන ගාස්තු දක්වා තිබෙනවා. එසේ අනුමත ගාස්තු වලට අනුකූලවයි එහි යෙදවීම් සිදු කරන්නේ. කිලෝමීටර දහයකට අඩු වූ විට එක් කිලෝ මීටරයකට රුපියල් 90.00ක් ද, කිලෝමීටර දහයට වැඩි වූ විට එක් කිලො මීටරයකට රු. 65.00ක් ද, නවතා තබන පැය අටක් සඳහා රු. 1500.00ක් වශයෙන් ද එම මිල කමිටු වාර්තාවලට අනුව අය කළ හැකියි. ගමනේ දුර ප්‍රමාණය අනුව අත්තිකාරම් මුදලක් අය කරගෙන වෑන් රථය ලබා දිය හැකියි.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් ඉතා හොඳ යෝජනාවක් කළා. එයට මා එකඟ වනවා.*

***ගරු සභාපතිතුමා***

*වෑන් රථය කුලී රථයක් වශයෙන් ලබා දීම ආදායම් අංශයට පවරනවා. එහි වගකීම ආදායම් පරීක්ෂක විසින් දැරිය යුතුයි. ඉන්ධන යෙදීම සහ අලුත්වැඩියා කටයුතු සම්බන්ධ වගකීම වාහන අධීක්ෂණය භාර නිලධාරී විසින් සිදු කළ යුතුයි. රියදුරාට කුලී රථයේ කටයුතු සඳහා වෙනම ජංගම දුරකථන සම්බන්ධතාවයක් තිබිය යුතුයි. මාසිකව යෙදෙන රාජකාරී ගමන් මාසය මුල දී හඳුනාගෙන එම දිනයන් වෙන් කරගෙන තිබිය යුතුයි.*

සභාවට ඉදිරිපත් කර ඇති වාහන ඉන්ධන වාර්තාවන්හි දක්නට ලැබෙන උච්ඡාවචනය වීම් සම්බන්ධව ගරු උප සභාපතිතුමන් විසින් විමසන ලදී.

*එම විමසීමට පිලිතුරු වශයෙන් ගරු සභාපතිතුමන් විසින් පසුගිය මාසයට අදාල වාහන ඉන්ධන වියදම් වාර්තාවන් ඉදිරිපත් කරන ලද අතර, නැවත සභාවට ඉන්ධන වාර්තා ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ මාසයට අදාල ඉන්ධන වාර්තාවන් වෙන වෙනම විධිමත් අයුරින් ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.*

රු. 10,000.00ට වැඩි ගෙවීම් සම්මත වීම මහා සභා වාර්තාවේ දැක්වීමේ දී එම ස්ථානයේ මුදල් කමිටු රැස්වීම් වාර්තාව යෝජනා ස්ථිරත්වය යටතේ සම්මත වූ බව සඳහන් කිරීම සුදුසු බව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 බලන්ගොඩ, කෙළින් වීදියේ පිහිටි වරිපනම් අංක 114 දරන කඩ කාමරය සම්බන්ධවයි - ඒ. එම්. ෆලීල් හාජ්ජියාර් මයා

බලන්ගොඩ, කෙළින් වීදියේ පිහිටි වරිපනම් අංක 114 දරන කඩ කාමරය වසා ඇති බැවින් එම කාමරය වරිපනම් මුදලින් නිදහස් කර දෙන මෙන් ඒ. එම්. ෆලීල් හාජ්ජියාර් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 බලන්ගොඩ, තුඹගොඩ පිහිටි වරිපනම් අංක 132/1/1 දරන කඩකාමරය සම්බන්ධවයි - ඒ. එම්. ෆලීල් හාජ්ජියාර් මයා

බලන්ගොඩ, කෙළින් වීදියේ පිහිටි වරිපනම් අංක 132/1/1 දරන කඩ කාමරය වසා ඇති බැවින් එම කාමරය වරිපනම් මුදලින් නිදහස් කර දෙන මෙන් ඒ. එම්. ෆලීල් හාජ්ජියාර් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

**06:03 පොදුවෙළඳසැල අංක 11 දරන කඩකාමරය ලබා දීම - ඊ. ජේ. කේ. පී. සුජීව ජයසේකර මයා**

කලක සිට වසා දමා ඇති පොදු වෙළඳසැල අංක 11 දරන කඩ කාමරය මාසික කුලී පදනම මත ලබා දෙන මෙන් බුලත්ගම, අංක 214 ස්ථානයේ පදිංචි ඊ. ජේ. කේ. පී. සුජීව ජයසේකර යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, මසකට රු. 2,000.00 බැගින් කුළිය අය කර අදාල අය වෙත එය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 කොස් අත්තක් කඩා වැටීමෙන් අබලන් වූ නිවස සඳහා ආධාරයක් ලබා ගැනීම**

පුපුලවත්ත, කුමාරගම පදිංචි ලීලා පුපුලවත්ත යන අයගේ නිවසේ කොටසක් කොස් අත්තක් කඩා වැටීම හේතුවෙන් අබලන් වී ඇති බැවින් ඒ සඳහා මූල්‍යමය ආධාරයක් ලබා දෙන මෙන් නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම්දුන් අතර, ඒ සඳහා රු. 5,000.00ක මුදලක් සභා අරමුදලින් ලබා දීමට යෝජනා කරන ලදී.

එම නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 රාස්සගල පාර සාංඝිකාරාම විහාරස්ථානයට අයත් ඉඩම වරිපනම් නිදහස් කිරීම**

රාස්සගල පාරට මුහුණලා සාංඝිකාරාම විහාරස්ථානයට අයත් ඉඩම රාස්සගල පාර, අංක 3, 3/3, 7/1 යටතේ තක්සේරු ලේඛනගතව ඇති අතර, මෙම ඉඩම් වලින් ආදායමක් නොමැති බැවින් වරිපනම් ගෙවීමට නොහැකි බව විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් පවසා ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, අදාල ඉඩම වරිපනම් අය කිරීමෙන් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 වරිපනම් අංක 84 1/3, 84 3/1 හා 84 1/3 දරන කාමර වල වරිපනම් නිදහස් කිරීම**

තමන් හට අයත් වරිපනම් අංක 84 1/3, 84 3/1 හා 84 1/3 දරන කාමර වල වරිපනම් මුදල් නිදහස් කරන මෙන් රත්නපුර පාර හි පදිංචි කේ. සන්මුගනාදන් සහ විජිතා සන්මුගනාදන් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, අදාල කාමර සඳහා වන වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 හපුතල පාර, අංක 111 ගොඩනැගිල්ල සඳහා 2014 වර්ෂයට බදු නිදහස් කිරීම**

හපුතලේ පාර, අංක 11 දරන ගොඩනැගිල්ල දැනට වර්ෂ තුනක පමණ සිට වසා ඇති බවත්, මෙම ගොඩනැගිල්ල සම්බන්ධව විහාරාධිපති ස්වාමීන් වහන්සේ, ඒ. පී. ගෝණකුඹුර

සහ උදම්මික පියසේන යන අය අතර, උසාවියේ නඩුවක් පවතින බවත් ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, දැනට එහි වරිපනම් රු. 33,298.00ක මුදලක් හිඟව ඇති අතර, එම මුදල ගෙවීමට අයෙක් නොමැති බැවින් බදු මුදලින් 50%ක් අඩු කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 වරිපනම් බදු අඩු කිරීම - කැමිලස් ප්‍රනාන්දු මයා**

බලන්ගොඩ, පරණ පාරේ අංක 25 හා රත්නපුර පාරේ අංක 40/1/1 දරන ගොඩනැගිලි දෙක වර්ෂ කිහිපයක සිට වසා ඇති බැවින් වරිපනම් ගාස්තුවෙන් නිදහස් කර දෙන ලෙස කැමිලස් ප්‍රනාන්දු යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් මහා සභාවට දැනුම් දුන් අතර, එම ස්ථානය සඳහා 50%කින් වරිපනම් ගාස්තු නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 ඩී - 02 කඩ කාමර ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීම -එම්. එන්. එම්. හසන් මයා**

බස් නැවතුම්පොල, උඩු මහල අංක ඩී - 02 දරන කඩ කාමරයේ වෙළඳාම අඩු බැවින් එහි ප්‍රමාද ගාස්තු අඩු කරදෙන මෙන් එම්. එන්. එම්. හසන් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම කඩ කාමරයට අදාල දඩ මුදල් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 කඩකුලී, ප්‍රමාද ගාස්තු ඉවත් කර දෙන මෙන් ඉල්ලීම - කේ. ඩී. ඩී. සිල්වා මයා**

ඩී - 9 දරන කඩ කාමරයේ කඩ කුලී ප්‍රමාද ගාස්තු ඉවත් කර දෙන මෙන් කේ. ඩී. ඩී. සිල්වා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම කඩවල වෙළඳාම අඩු බැවින් අදාල දඩ මුදල් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 2010/2011 හා 2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම**

2010/2011 හා 2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද සිසුන්ගේ නාම ලේඛනය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | නම | ලිපිනය | අධ්‍යයන වර්ෂය | විශ්ව විද්‍යාලය | පාඨමාලාව |
|---|---|---|---|---|---|
| 1. | කේ.ඩබ්. දමිත් මදුෂාන් | 30/10,සරස්වති පාර,ඇල්ලෙපොල, බළන්ගොඩ | 2010/2011 | ජයවර්ධනපුර | වාණිජ |
| 2. | වත්සලා සඳමාලී | නො.55, කිරිදිගල,බළන්ගොඩ | 2010/2011 | සබරගමුව | කලා |
| 3. | කේ. එම්. එම්. උදාරිකා නයනානන්ද | 13/2ඒ, කරවිකැටිය, බළන්ගොඩ | 2010/2011 | සබරගමුව | කළමනාකරණ |
| 4. | චතුමිණි උදේශිකා | අංක 94, ඕලුගන්තොට, බළන්ගොඩ | 2010/2011 | කැලණිය | කලා |
| 5. | ඒ. එම්. චතුර මදුෂාන් | 398/2, කිරිඳිගල, බළන්ගොඩ. | 2010/2011 | කැලණිය | කලා |
| 6. | ජී.චින්තක තුෂාර ගමගේ | නො. 502, ඇල්ලෙපොල, බළන්ගොඩ | 2010/2011 | ත්‍රිකුණාමලය | කළමනාකරණ |
| 7. | මහේෂා සෙව්වන්දි | නො. 02, කරවිකැටිය පාර,බළන්ගොඩ | 2010/2011 | රුහුණු | වෛද්‍ය |
| 8. | එම්. කේ. පී. නෙළුම් උදයංගනී පෙරේරා | නො 22,පරගහකුඹුර පාර, බළන්ගොඩ. | 2011/2012 | යාපනය | කළමනාකරණ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. | එම්. ඩබ්. ඉඳුනිල් උත්තරා ජයමාන්න | අංක 25/ඒ, උඩ ඇල්ලෙපොල බළන්ගොඩ | 2011/2012 | කැලණිය | භාෂාව හා කථනය |
| 10. | ඩබ්. පියුමි අත්තනායක | නො.9/ඩී, ඇල්ලෙඅරාව,බළන්ගොඩ | 2011/2012 | කැලණිය | වෛද්‍ය |
| 11. | ඩබ්. ජී. එස්. ටී. සමරසුන්දර | බණ්ඩාරවත්ත, මුතුණමලය,බළන්ගොඩ | 2011/2012 | සබරගමුව | කළමනාකරණ |
| 12. | කේ. කේ. ඉරෝෂා උදයංගනී | නො. 21,වැලිහරණාව පාර, බළන්ගොඩ | 2011/2012 | කැළණිය | වානිජ්‍ය |
| 13. | පී. ඩබ්. චතුරිකා සඳමාලි | නො. 157, පිරිවන පාර, මිරිස්වත්ත, බළන්ගොඩ | 2011/2012 | රජරට | කලා |
| 14. | ඩී. එල්. තිළිණ දිලංක | බණ්ඩාරවත්ත, මුගුණමලය, බළන්ගොඩ | 2011/2012 | රජරට | වෛද්‍ය |
| 15. | මහේෂා සෙව්වන්දි | කරවිකැටිය පාර, බළන්ගොඩ | | | |

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 කාරක සභා සඳහා සාමාජිකයන් නම් කිරීම**

මෙම සභාවේ සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව, කර්මාන්ත කාරක සභාව, මුදල් කාරක සභාව, තානායම් කාරක සභාව, පුස්තකාල උපදේශන කාරක සභාව, ආපදා කළමනාකරණ සහ දේශගුණික විපර්යාස අවම කිරීමේ කාරක සභාව, ගැටුම් නිරාකරණය කිරීමේ කාරක සභාව, සහ සංවර්ධන උපදේශන කාරක සභාව සඳහා පත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 සෙනසුරාදා පොළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත**

සෙනසුරාදා පොල අතුරු ව්‍යවස්ථාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර එය මහා සභාවේ සම්මත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, ඒ සම්බන්ධව පහත පරිදි නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*පසුගිය දා වෙළඳ සංගමයේ රැස්වීමක් පැවැත්වූනා. එහි දී ගරු සභාපතිතුමන් ප්‍රශ්නය සමඟ පිළිතුර ද දී පිටත් වූ බවයි එහි සිටි අය ප්‍රකාශ කළේ. වෙළඳ සංගමයේ වැඩි දෙනෙකුගේ කැමැත්ත ඇත්තේ පොළ ඉරිදා දිනයේ පැවැත්වීමටයි. නගරය තුළ ජීවත් වන පුද්ගලයකු හා ව්‍යාපාරිකයකු වන මා සමඟ මේ පිළිබඳව අදහස් දක්වනවා. නගරය අවට සෙනසුරාදා පොළ පහක් පැවැත්වෙනවා. නාගරික ජනතාව ගමේ එළවලුවක් පොළෙන් මිල දී ගැනීමට බලාපොරොත්තු වන්නේ. ඉරිදා පොළ වෙනස් කිරීමෙන් එම අවස්ථාව නැති වේ යැයි ඔවුන්ගේ බයක් තිබෙනවා. මගේ අදහසත් පොළ ඉරිදා දිනයේ පැවැත්විය යුතු බවයි.*

***ගරු සභාපතිතුමා***

*දිනයක් වෙනස් වූ පමණින් වෙළඳ ව්‍යාපාරිකයන්ට කිසිවක් වන්නේ නෑ. පෝය දිනයක් ඉරිදාට යෙදුණු විට සෙනසුරාදා දින පොළ පවත්වනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*වෙළඳ ව්‍යාපාරිකයන්ට පමණක් නොවෙයි, මෙයින් පාරිභෝගිකයන්ට ද බලපෑමක් සිදු වනවා. නගරයේ දී හමුවන පාරිභෝගිකයන් මා හට ඒ බව පවසා තිබෙනවා. මේ දින වෙනස් කිරීම සම්බන්ධයෙන් නිහඬව සිටීමට අපට හැකියාවක් නෑ. ජනතාව නියෝජනය කිරීමටයි මන්ත්‍රීවරයකු වශයෙන් පත්ව සිටින්නේ.*

***ගරු සභාපතිතුමා***

*දැනට ඇති ස්ථානයට ගෙන ඒමට පෙර පස් වතාවක් පොළ පවත්වන ස්ථානය මාරු කළා. ලංකාවේ දිගම පොළ වශයෙන් ද කලක් හැඳින්වූවා. නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබාගෙන නගර සභා අරමුදලෙන් පොළ ඉදිකරනු ලැබූ නිසා එක් තැනක ස්ථානගත වී තිබෙන්නේ. ගොවියන් සඳහා මෙය නිර්මාණය කළත් ගොවියන්ගේ එළවලු මේ පොළට එන්නේ නෑ. වැලිගෙපොල සහ වේලිඔය පොළවල් වලට එම එළවලු එන්නේ. දැන් කිරිමැටිතැන්න මාර්ගයේත් පොළක් ආරම්භ කර තිබෙනවා. මාර්ගයේ දූවිල්ල සමඟ එළවලු ඇති නිසා ඒවා මහජනයාට භාවිතයට නුසුදුසුයි. මා ද මේ පොළේ ව්‍යාපාර සිදු කරන නිසා ඒ සම්බන්ධව හොඳින් දන්නවා. සෙනසුරාදා සහ ඉරිදා දින දෙකම රජයේ නිවාඩු දිනයක් නිසා පාරිභෝගිකයන්ට ගැටලුවක් වන්නේ නෑ. මේ වන විට ඉරිදා දින ටියුෂන් පංති නවත්වා තිබෙනවා. ක්‍රිස්තියානි ආගමේ අය ඉරිදා දිනයේ පල්ලියට යන්නේ. පොළේ කඩකාමර ප්‍රමාණය වැඩි කළේ සභාවට වැඩි ආදායමක් ලබා ගැනීමටයි. වේලිඔය පොළට ගෙනෙන එළවලු සෙනසුරාදා උදෑසනම ගොවියාට ඒ වෙනුවට බලන්ගොඩ පොළට ගෙන ඒමට හැකියි. එසේ නොමැති නම් සිදුවන්නේ ඉරිදාට එම එළවලු අතර මැදියෙක් හරහා පොළට පැමිණීමයි. සෙනසුරාදා පොළ මාස කිහිපයක් අත්හදා බලමු. සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වෙන බවට ප්‍රචාරය කර තිබෙන්නේ.*

### ගරු උප සභාපතිතුමා

*මේ සඳහා අනවශ්‍ය කාලයක් ගත කළා. පසුගිය වර සභාවේ දී ඉරිදා පොළ වෙනස් කිරීමට හේතු ගරු සභාපතිතුමන් සඳහන් කළා. නගරයේ වෙළෙන්දන් ආරක්ෂා කර ගැනීම, අලුත් එළවලු ජනතාවට ලබා දීම, එයින් සභාවේ ආදායම වැඩි කර ගැනීම, ආදියට යෝජනාව ඉදිරිපත් කළ බව දැක්වූයේ. වෙළඳ සංගමයේ රැස්වීමට අප සහභාගී වූවා. එහි සිටි කිසිදු වෙළෙන්දෙක් ඉරිදා පොළ දිනය වෙනස් කරනවාට කැමති වූයේ නෑ. සභාපතිතුමා ඉදිරියේ මේ බව කීමට ඔවුන් බියයි. පොළ වෙනස් කිරීමට අවශ්‍ය බව අප සමඟ මෙතෙක් කිසිවකු පවසා නෑ. සභාපතිතුමන් බලහත්කාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් මේ දිනය වෙනස් කළොත් අප රණ්ඩු කරන්නේ නෑ. නමුත් ජනතාවගේ අදහස අප ඉදිරිපත් කරන්නේ. අප ඉරිදා පොළ සෙනසුරාදාට මාරු කරන විට බලන්ගොඩ ප්‍රාදේශීය සභාව සිකුරාදා දිනට ඔවුන්ගේ පොළ වෙනස් කරනවා. එවිට වෙනසක් සිදුවන්නේ නෑ. ඉරිදා දිනයේ ජනතාව පල්ලි යාමෙන් පසු පොළට පැමිණෙන බව ද, දරුවා දහම් පාසැලට ගෙන යාමෙන් පසු දෙමව්පියන් පොළට පැමිණෙන බව ද මා පවසනවා. සෙනසුරාදාට ඇතැම් ආයතන වැඩ. සමහරෙක් කියන පරිදි දඹුල්ලේ එළවලු මිල සෙනසුරාදාට වැඩියි. සිකුරාදා මිල අඩුයි. මේ සම්බන්ධවත් එළවලු ගෙන එන අය සලකා බලනවා. පොළ දිනය වෙනස් කළත් නොකළත් පොළ කඩ කාමර වලින් නියමිත ආදායම ලැබෙනවා. පොළ සෙනසුරාදා දිනයේ පැවැත්වීමට මා ජනතාව වෙනුවෙන් විරුද්ධ වනවා.*

### නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා

*ඉරිදා පොළ සෙනසුරාදා දිනයට මාරු කිරීම වැඩි දෙනෙකුට අපහසුතාවයන් ඇති කරවන බව අප හට බොහෝ දෙනෙකු විසින් දන්වා තිබෙනවා. නගරයේ බදු ගෙවන වෙළෙන්දන් රැකීමට හා නැවුම් එළවලු හා පළතුරු මිල දී ගැනීම බලාපොරොත්තු වනවා නම් නගරයේ බදු ගෙවන එළවලු තොග වෙළෙන්දන් කොපමණ සිටිනවා දැයි සලකා බැලිය යුතු වනවා. එසේ වුවහොත් පොළේ ඒකාධිකාරයක් ඇති විය හැකියි. පිට පළාත් වලින් තොග වෙළෙන්දන් පැමිණි විට තරගකාරී තත්ත්වයක් යටතේ අඩු මිලට භාණ්ඩ ලබා ගැනීමට ජනතාවට අවස්ථාව ලැබෙනවා. පොළ සෙනසුරාදා දින පැවැත්වීමට වඩා තිබුණු අයුරින්ම ඉරිදා දින පැවැත්වීම සුදුසු බව ජනතාව වෙනුවෙන් මා ප්‍රකාශ කරනවා.*

### නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

*මා පසුගිය ඉරිදා පොළට ගිය පසු එහි සිටි පිරිස විමසුවා පොළ දිනය වෙනස් කිරීමට එරෙහිව අප ගත් ක්‍රියාමාර්ගයන් පිළිබඳව. එවිටයි මා දැන ගත්තේ මේ සම්බන්ධව ජනතාවගේ විරෝධතාවක් පවතින බව. බලන්ගොඩ ඉරිදා පොළට වසර සියයකට වැඩි ඉතිහාසයක් තිබෙනවා. ඉරිදා දිනයේ සියලුම දෙනාට නිවාඩු තිබෙන්නේ. සෙනසුරාදා දිනයේ වතුවල වැඩ කරනවා. ඔවුන්ට එදින පොළට පැමිණීමට හැකිවන්නේ නෑ. පෞද්ගලික පංති පවත්වන්නේ සෙනසුරාදා දිනයේ.*

*එබැවින් ඉරිදා දිනයේ වැඩි දෙනෙක් පොළට පැමිණෙනවා. ව්‍යාපාරිකයන් සෙනසුරාදා දිනයේ කොළඹ ගොස් බඩු ගෙන එනවා. ඔවුන්ටත් සෙනසුරාදා දිනයේ පොළ තිබීම අවාසියක් සිදුවන්නේ. සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වූවොත් අවට පොළ වල වෙළෙන්දන් මෙහි පැමිණෙන්නේ නෑ. ඔවුන් සෙනසුරාදා පොළ පවත්වා උපයා ගන්නා මුදල් වලින් ඉරිදා දිනයේ බඩු මිලට ගැනීමට නගරයට පැමිණෙන නිසා අනෙක් වෙළඳ සැල් වලටත් වාසියි. මහජන ඉල්ලීම අනුව සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වීමට මා විරුද්ධයි. එදින පොළ පැවැත්වීමට ජනතාවගෙන් ඉල්ලීමක් ආවොත් ඒ ගැන සලකා බැලීම සුදුසුයි.*

**නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

*වතු කම්කරු නිවාඩු ඉරිදා දිනයේ ලබා දී ඇත්තේ, ඉරිදා පොළ සෙනසුරාදා දින පැවැත්වීමට මා විරුද්ධයි.*

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා**

*නගර සභාවෙන් මෙතෙක් සිදු කළ සියලු වැඩසටහන් සාර්ථකයි. යෝජනාවක් කළ විට විරුද්ධ අදහස් ප්‍රකාශ වනවා. නමුත් පසුව සාර්ථක ප්‍රතිඵල ලබාගෙන තිබෙනවා. තානායම ලාභ ලබන ආයතනයක් වශයෙන් සාර්ථකව පවත්වාගෙන යාම මෙයට හොඳ උදාහරණයක්. පෝය ඉරිදාට යෙදී ඇති දිනවල සෙනසුරාදා පොළ පැවැත්වූ විට ජනතාවට අඩුපාඩුවක් සිදු වූ බව මා දන්නේ නෑ. ඇතැම් විට අවට පොළ වල ඉතිරිවන එළවලු ද්‍රව්‍ය ඉරිදා දිනයේ බළන්ගොඩ පොළට පැමිණීමට ද ඉඩකඩ තිබෙනවා. එම නිසා ඉරිදා පොළ සෙනසුරාදාට වෙනස් කිරීම මාසයක් හෝ මාස දෙකක් අත්හදා බැලිය යුතුයි. ඉරිදා ලැබුණු තරමේ වෙළඳාමක් සෙනසුරාදා නොලැබුණොත් වෙනස් කළ හැකියි. බළන්ගොඩ වෙළඳ ව්‍යාපාරිකයන් හදවත බඳුයි. ඔවුන් ආරක්ෂා කිරීම අවශ්‍යයි. කොළඹ ඇතුලු සෑම ප්‍රදේශයකම ඉරිදා නිවාඩු දිනයක්. මෙයට විරුද්ධ බව මා සමඟ කිසිවකු පැවසුවේ නෑ. සෙනසුරාදා දිනයට වෙනස් කිරීමේ ගැටලුවක් වන බව මා සිතන්නේ නෑ.*

**නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

*සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වීමට නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වැඩි දෙනෙකු විරුද්ධ බව පෙනෙනවා. වෙළඳ සංගමය සහ ප්‍රජා සංවිධානයන් ද විරුද්ධ බව ප්‍රකාශ වුනා. ජනතා නියෝජිතයන් වශයෙන් අප ජනතාවගේ හඬට ද කණ් දිය යුතුයි. සෙනසුරාදා දිනයේ අවට ප්‍රදේශවල පොළ කිහිපයක් පැවැත්වෙනවා. ඉරිදා පොළට පැමිණෙන බාහිර වෙළෙන්දන්ගෙන් විමසූ විට ඔවුන් ප්‍රකාශ කළේ, සෙනසුරාදාට පොළ දිනය වෙනස් කළ හොත් ඔවුන් ද බළන්ගොඩ පොළට පැමිණෙන බවයි. බළන්ගොඩ එළවලු කොළඹ මැනිං වෙළඳසැලේ අඩු මිලට තිබෙනවා. කොළඹ නගරයේත් ඉරිදා දින වෙළඳසැල් වසා තිබෙනවා. වෙළඳ ඒකාධිකාරයක් ඇති වන බවට ද මතයක් තිබෙනවා. නමුත් අප මේ වන විට දැනුම් දී තිබෙනවා සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වෙන බව. ජනතාව ඒ නිසා සෙනසුරාදා දිනයේ පැමිණ ඉරිදා දිනයේ නොපැමිණියොත් පාඩුවක් සිදුවනවා. ලබන සෙනසුරාදා පොළ පවත්වා එදින සුදුසු නැති නම් වෙනස් කළ හැකියි. වෙළඳ සංගමයේ අය මෙයට විරුද්ධයි.*

**නගර සභා මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා**

*සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වෙන බවට ප්‍රචාරය කර ඇති නිසා ලබන සතියේ සෙනසුරාදා පොළ පැවැත්වීම සුදුසුයි. නගරයේ කිසිවකු මා හට සෙනසුරාදා පොළ නොපැවැත්විය යුතු බව මා හට ප්‍රකාශ කර නෑ. පොළ සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වීමට මගේ විරෝධතාවයක් නෑ.*

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

*සෙනසුරාදා දිනයේ පොළ පැවැත්වීම සම්බන්ධව විරෝධතාවයක් ඇති වූ බැවින් ඡන්ද විමසීමක් අවශ්‍යයි.*

**ගරු උප සභාපතිතුමා**

*මේ ගරු සභාපතිතුමන් සමග පෞද්ගලික විරෝධයක් නොවෙයි. ජනතාවගේ අදහසයි ඉදිරිපත් කළේ.*

***ගරු සභාපතිතුමා***

*පොළ ඉරිදා දිනයේත් පැවැත්වීමට කටයුතු කරනවා. කිසිවකුට බිම එළවලු දමා අලෙවි කිරීම නොකළ යුතුයි. සතියේ සෑම දිනයකම ජනතාවට පැමිණීමට ඉඩ දෙනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*ගරු සභාපතිතුමන්ගේ නම්‍යශීලී භාවයට සභාවේ ගෞරවය පළ කිරීමට යෝජනා කරනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*එම යෝජනාව මා ස්ථිර කරනවා.*

**න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යැවීමෙන් පසු මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා**

**06:14 සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනය**

මෙම සභාවට 2014 වර්ෂයේ දී අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත්, කොන්ත්‍රාත් කටයුතු සඳහා සුදුසු සහ ඒ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමටත් 2013.09.24 වන දින පැවති මහා සභාවේ අනුමැතිය ඇතිව 2013.10.12 දිනැති දිනමිණ පුවත්පතේ සහ 2013.10.14 දරන තිනකරන් පුවත්පතෙහිත් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් වලට අනුව ඒ ඒ අයිතමයන් යටතේ මෙම සභාවට ලියාපදිංචි ගාස්තු ගෙවා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 වාහන නැවැත්වීමේ තහනම ඉවත් කර ගැනීම - එම්. අමරසේන මයා**

නන්දන හෝටලය නම් තම ආයතනය ඉදිරිපිට තබා ඇති ''වාහන නැවැත්වීම තහනම්'' පුවරුව ඉවත් කරන මෙන් බලන්ගොඩ, තුඹගොඩ, අංක 99, ස්ථානයේ එම්. අමරසේන නමැති අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එම පුවරුව ඉවත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 වරිපනම් බදු අඩක් නිදහස් කර ගැනීම - රත්නපුර පාර අංක 47, 45 1/1, 49 1/1**

රත්නපුර පාරේ අංක 47 හි උඩුමහල, 45 1/1 හා 49 1/1 දරන එරංග තේනුවර යන අයගේ නමින් ලේඛනගතව ඇති ගොඩනැගිලි වල වරිපනම් බදු අඩක් නිදහස් කරන ලෙස ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 එළුමස් කඩ කාමරය සම්බන්ධව - ඩී. එම්. දරුක් මයා**

එළුවන් රක්වාන ප්‍රදේශයේ ඝාතනාගාරයට රැගෙන යාම අපහසු බැවින් නගර සභාවට අයත් ගව ඝාතනාගාරයේම මස් බවට පත් කිරීමට අවසරය ලබා දෙන මෙන් ඩී. එම්. දරුක් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 2014 වසරේ මස් කඩ ටෙන්ඩරය - එම්. ආර්. එම්. රියාස් මයා**

රක්වාන ගව ඝාතකාගාරය අලුත්වැඩියා කරන තෙක් බළන්ගොඩ නගර සභාවට අයත් ගෝ ඝාතකාගාරයේම ගව ඝාතනය කිරීමට එම්. ආර්. එම්. දරුක් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, දින 14ක් සඳහා තාවකාලික බලපත්‍රයක් නිකුත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිරකරන ලද, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 නගර සභාවට වසර 10ක් සඳහා ඉඩම ලබා දීම - ඩී. එම්. ෆලීල් මයා**

වසර 10ක කාලයක් සඳහා තම ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගව ඝාතනාගාරයක් තැනීම සඳහා ලබා දීමට මිරිස්වත්ත, බළන්ගොඩ පදිංචි ඩී. එම්. පලීල් යන අය විසින් කැමැත්ත පළ කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වටිනාකම තක්සේරු කරවා එම මුදලට අදාල ඉඩම ලබා ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 බිල්පත් ප්‍රතිපූරණය කරන දුරකථන අංකය වෙනස් කර ගැනීම - ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

දැනට තම 045-2287023 දරන දුරකථනය සඳහා සභාවෙන් බිල්පත් ප්‍රතිපූරණය කරන බවත්, ඒ වෙනුවට මින් ඉදිරියට තම 077-3497834 දරන ජංගම දුරකථනය සඳහා බිල්පත් ප්‍රතිපූරණය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඉහත යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:21 නව මෘදුකාංගයක් ලබා ගැනීම - පුස්තකාලයාධිපති**

මහජන පුස්තකාලයේ දැනට භාවිත වන මෘදුකාංගය වෙනුවට නව මෘදුකාංගයක් සහ ජාල කැමරාවක් සඳහා ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, මෙම ආයතනයේ පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු සමඟ සාකච්ඡා කර තීරණයක් ගෙන මහා සභාව වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:22 පුස්තකාල උපදේශන කමිටු සාමාජිකයන් පත් කිරීම**

පුස්තකාල උපදේශන කමිටු සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය .

**06:23 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල පිළිබඳව**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල වශයෙන් රු. 10,000.00ක් ගෙවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:24 ඩී - 26 දරන කඩකාමරයේ හිඟමුදල - ජේ. ඒ. එරාන් ද සිල්වා**

බලන්ගොඩ බස් නැවතුම්පොල අංක ඩී - 26 දරන කඩඩ කාමරයේ දඩ මුදල් නිදහස් කරන මෙන් ජේ. ඒ. එරාන් ද සිල්වා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, සියලුම හිඟ මුදල් අයකර දඩ මුදල් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:25 ඩී - 27 කඩකාමරය නැවත පවරා දීම - බදුර්දීන් මොහොමඩ් නස්රින් මයා**

තමන් විසින් පවත්වාගෙන යනු ලබන බස් නැවතුම්පොල ඩී - 27 කඩකාමරය කෙහෙල්ඕවිටගේ ධනුක මහේෂ් හෙළපල්ල යන අය වෙත පවරා දෙන ලෙස බදුර්දීන් මොහොමඩ් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, අය විය යුතු ගාස්තු අයකර ගැනීමෙන් පසු එම අය වෙත පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු චමික ජයමිණි වැවේගෙදර  මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:26 2014 අභ්‍යන්තර විගණන වැඩසටහන**

2014 වර්ෂයට අදාල මෙම සභාවේ අභ්‍යන්තර විගණන වැඩසටහන ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:27 නීති කෘත්‍යයන් සඳහා පෙනී සිටීම වෙනුවෙන් ඩී. එම්. චන්ද්‍රසේකර මයා**

මෙම සභාවට අදාල 3089/ඉඩම්, 2610/ඉඩම්, 2609/ඉඩම්, 2611/ඉඩම්, 3701/ඉඩම්, 327/යොමු, 2015/බෙදුම් යන අංක දරන නීතිකෘත්‍යයන් සදහා පෙනී සිටීම වෙනුවෙන් රු. 45,000.00ක මුදලක් නීතිඥ ඩී. එම්. චන්ද්‍රසේකර මහතා විසින් ඉල්ලා ඇති අතර එම මුදල ගෙවීමටත්, 2014 වර්ෂය සඳහා ද මෙම සභාවට අයත් අධිකරණ කටයුතු සඳහා ඩී. එම්. චන්ද්‍රසේකර මහතා සහභාගී කරවා ගැනීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ඉහත යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:28 හිඟ කඩකුළී අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම**

මෙම සභාවට අයත් පොදු වෙළඳ සැල කාමර අංක 11 සහ පොදු වෙළඳසැල අංක 14 යන කඩ කාමර නියමිත මුදල් නොගෙවීම මත වෙනත් බදුකරුවන් තෝරාගෙන ලංසු කර ඇති බවත්, එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භක කාලය තෙක් පැරණි බදුකරු විසින් මෙම සභාවට ගෙවිය යුතු හිඟ මුදල් මේ වන තෙක් ගෙවා නොමැති බවත්, අදාල මුදල් ගෙවා නිම කරන ලෙස කිහිප වතාවක් දන්වා ඇති බවත්, එම නිවේදනයන්ට ප්‍රතිචාර නොදක්වවමින් අදාල මුදල් නොගෙවීම හේතුවෙන් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනත අනුව අධිකරණමය ක්‍රියාමාර්ගයකට එළැඹිය හැකි බවත් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල කඩකාමර පවත්වාගෙන ගිය ප්‍රියන්ත මුතුමාල යන අය සහ චන්දන සෝබා මුතුමාල යන අය වෙත මෙම සභාවෙන් ගෙවීමට ඇති වවුචර වලින් අදාල හිඟ මුදල් අය කර ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:29 2014 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාවෙහි කඩකුලී අඩු කර ගැනීම**

බලන්ගොඩ මහජන පොළේ තමන් විසින් පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවේ ආදායම ඉතා අඩු බැවින් 2014 වර්ෂයට අදාල මාසික කඩකුළිය අඩුකර දෙන මෙන් බී. ගුණරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, මේ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පිළිතුරක් ලැබී නොමැති බැවින් අදාල මුදල රු. 10,000.00 දක්වා අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:30 වරිපනම් බදු අඩු කිරීම (අංක 174 ඒ, 174 2/1)**

හපුතලේ පාර, අංක 174 දරන ගොඩනැගිල්ලේ උඩු මහලේ මැණික් වෙළඳාමක් නොමැති බැවින් 1/2 හා 174 ඒ යන කොටස් සඳහා වරිපනම් නිදහස් කර දෙන ලෙස බී. සිරිල් ප්‍රනාන්දු යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, 50% ප්‍රමාණයකින් වරිපනම් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික සම්මත විය.

**06:31 ගෙවත්ත අලංකාරව පවත්වාගෙන යාම සම්බන්ධව ප්‍රසාදය පළ කිරීම.**

වැවේවත්ත නිවාස යෝජනා ක්‍රමයේ අංක 151/18 දරන නිවසේ පදිංචි උපාලි ජයතිස්ස මහතා තම ගෙවත්ත හා මාර්ගය දෙපස තණකොළ වවා අලංකාරව පවත්වාගෙන යන බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැන්වූ අතර, ඒ වෙනුවෙන් සභාවේ ප්‍රසාදය පළ කිරීමටත්, රු. 5,000.00ක මුදල් ත්‍යාගයක් ලබා දීමටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:32 2013 වර්ෂයට අදාල බිල්පත් ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම**

මෙම සභාවට අයත් සියළු වාහන අලුත්වැඩියාව, මිල දී ගැනීම හා සේවා කිරීමට සහ භාණ්ඩ හා සේවා සපයා ගැනීමට අදාලව 2013.12.30වන දින වන විට ගෙවීම් කටයුතු

කිරීමට මෙතෙක් ගෙවීම් සිදු කර නොමැති බිල්පත් සඳහා ගෙවීම් කිරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:33 ''අරුණළු'' මාසික සඟරාව**

මෙම සභාව විසින් ප්‍රකාශයට පත් කරන 'අරුණළු' නාගරික සංවර්ධන පුවත් එකතුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:34 පොදු වෙළඳසැල අංක 11 කඩකාමරය කුලී පදනම මත ලබා දීම**

පොදුවෙළඳසැල අංක 11 දරන කඩකාමරය මාසික කුලී පදනම මත ලබා දෙන මෙන් බලන්ගොඩ, බුලත්ගම, අංක 214 ස්ථානයේ පදිංචි ඊ. ජේ. කේ. පී. සුජීව ජයසේකර යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම කඩ කාමරය පසුගිය සභාවාරයේ දී රු. 3,000.00 බැගින් මාසික කුලී පදනම මත සුජීව ජයසේකර යන අය වෙත ලබා දී ඇති නමුත්, ඔහු එම ස්ථානය හිස් පෙට්ටි තබා ගැනීමට පමණක් භාවිත කරන බැවින් අංක 14 කාමරය සඳහා අයකරනු ලබන රු. 2,000.00 මාසික කුලී මුදලට ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:35 සී - 50 කඩකාමරයේ බදු මුදල් නිදහස් කිරීම - කේ. ඩී. මංජුල ප්‍රසන්න මහතා**

තමන් විසින් ලබා ගෙන ඇති බස් නැවතුම්පොල සී - 50 දරන කඩකාමරයේ වෙළඳාම අඩු බැවින් එයට අදාල දඩ මුදලෙන් නිදහස් කරන මෙන් කේ. ඩී. මංජුල ප්‍රසන්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, උඩු මහලේ කඩ වල වෙළඳාම අඩු බැවින් අදාල දඩ මුදල් නිදහස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:36 බලන්ගොඩ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් සහ නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ නීති රීති ක්‍රියාත්මක කිරීමේ දී මතුව ඇති ගැටලු නිරාකරණය කර ගැනීම පිළිබඳ විශේෂ සාකච්ඡාව**

බලන්ගොඩ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් සහ නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ නීති රීති ක්‍රියාත්මක කිරීමේ දී මතුව ඇති ගැටලු නිරාකරණය කර ගැනීම පිළිබඳව 2013.12.01 වන දින බලන්ගොඩ තානායමේ දී පැවති විශේෂ සාකච්ඡාවේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විස්න ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:37 මහජන පොල අංක 14 ලබා ගැනීම - පී. කේ. බේබි නෝනා මිය**

මහජන පොල අංක 14 කඩ කාමරය තමන් වෙත ලබා දෙන මෙන් පී. කේ. බේබිනෝනා යනඅය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, අයවිය යුතු මුදල් ලබා ගැනීමෙන් අනතුරුව එය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:37 බලන්ගොඩ නගරයේ රථවාහන සැලැස්ම සකස් කිරීමේ සාකච්ඡාව**

2013.10..24 වන දින පැවති බලන්ගොඩ නගරයේ රථවාහන සැලැස්ම සකස් කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එය සභාවේ සම්මත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

සභා යෝජනා අංක **12:01** යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට රු. 10,000.00ට වැඩි ගෙවීම් ඇතුළත් වේ.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 බලන්ගොඩ නගර සභා තානායමෙහි නාන කාමර වල ටයිල් ඇතිරීම (කාමර - 03)**

බලන්ගොඩ නගර සභා තානායමෙහි නාන කාමර වල ටයිල් ඇතිරීම (කාමර - 03) කර්මාන්තය සඳහා රු. 197,793.48ක මුදලක් වැය වන බවට ඇස්තමේන්තු කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:01 බලන්ගොඩ නගර සභා පරිශ්‍රයෙහි ගබඩා සංකීර්ණය ඉදිකිරීම**

බලන්ගොඩ නගර සභා පරිශ්‍රයෙහි ගබඩා සංකීර්ණය ඉදිකිරීම කර්මාන්තයට අදාල රු. 1,346,958.21ක ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබිණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

**11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

11:01:01 2014 වර්ෂයේ සිට මාසික මහා සභා රැස්වීම සෑම මසකම අවසාන සතියේ බ්‍රහස්පතින්දා දින පැවැත්වීම

11:01:02 රථවාහන සැලැස්ම මහා සභාවේ යෝජනා අනුව පොලිස් ස්ථානය මගින් සිදු කිරීම

11:01:03 නගර සභාව සතු සියලු දේපල, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම

11:01:04 රථවාහන, යන්ත්‍ර - සූත්‍ර, ලී බඩු හා උපකරණ පිලිබඳව කටයුතු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම

11:01:05 නගර සභාවේ සියළුම කාරක සභාවන් සඳහා 25%ක කාන්තා නියෝජනයක් ඇති කිරීම

11:01:06 මෙම නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රෙමතිලක මැතිතුමා හට ලැබී ඇති ස්ථාන මාරුව අවලංගු කිරීම

ඉහත යෝජනාවන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

11:01:01 ගරු සභාවේ යෝජනා හැර එය ස්ථිර කිරීමෙන් පසු ඒ යෝජනාව ගැන කථා කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ වෙනසක් කිරීමට කටයුතු කරන්නේ නම්, ඒ ගැන ඇති නීති රීති හා සම්ප්‍රදායන් පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් වීම නැවතත් අවශ්‍ය වී ඇත. මේ සම්බන්ධයෙන් සභාවේ දී සාකච්ඡාවට ලක් කිරීම.

11:02:02 සුදර්ශන පුර හා ලේඩිස්මිත් වත්ත සඳහා වීදි ලාම්පු දෙකක් ලබා දීම

ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් අතරින් පළමු යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ඉල්ලා අස් කර ගන්නා ලද අතර දෙවන යෝජනාව ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

11:03:01 ආනන්ද මෛත්‍රෙය ජාතික පාසල් වටරවුම් පාර, දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම (ආනන්ද මහතාගේ නිවසට යන පාර)

11:03:02 සුබෙයිර් ආලීම් මාවත පළමු පටුමග කොන්ක්‍රීට් කිරීම

11:03:03 සුබෙයිර් ආලීම් මාවත දෙවන පටුමග ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජනාවන්ට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

11:04:01 අයවැය ප්‍රතිපාදන වලින් අඩු ආදායම්ලාභීන්ට ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ලබා දීම

11:04:02 කුමාරගම පුපුලවත්ත මහතාගේ නිවස අසළ ප්‍රදේශයට වීදි පහනක් සවි කිරීම

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට මහා සභා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 මුදල් කාරක සභා වාර්තාව

2013.12.23 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 සෞඛ්‍ය හා සන අපද්‍රව්‍ය උපදේශන කාරක සභා වාර්තාව

2013.12.24 වන දින පැවති සෞඛ්‍ය හා සන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 තානායම් කාරක සභා වාර්තාව

2013.12.23 වන දින පැවති තානායම් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:04 ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව

2013.12.24 වන දින පැවති ආපදා කළමනාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

2013 නොවැම්බර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 9,695,532.26 |
| වෙනත් ලැබීම් | 1,170,730.49 |
| **මුළු ලැබීම්** | **10,866,262.75** |
| පුනරාවර්තන වියදම් | 14,236,807.30 |
| වෙනත් වියදම් | 2,723,730.87 |
| **මුළු වියදම්** | **16,960,538.17** |

- බලන්ගොඩ තානායමේ 2013.10.01 වන දින සිට 2013.10.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සහ 2013.11.01 සිට 2013.11.30 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම් ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.10.01 සිට 2013.10.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2013.10.01 සිට 2013.10.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 542,155.80 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. වෙනත් කරුණු

**13:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

අලංකාර අයවැය ලේඛනයක් සාදා දීම සම්බන්ධයෙන් ගණකාධිකාරීතුමන් ඇතුලු කාර්ය මණ්ඩලයට පළමුවෙන්ම ස්තුතිවන්ත වන බව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් සඳහන් කරන ලදී. පළාත් පාලන ආයතන 11ක අයවැය පරාජයට පත් වී ඇති බවත්, මෙම නගර සභාවේ අයවැය සම්මත කිරීම සඳහා සහයෝගය දුන් ගරු උප සභාපතිතුමන් ඇතුලු ආණ්ඩු පක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වන බවත් එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එම අවස්ථාවේ දී විපක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා ක්‍රියා කළ ආකාරය සුදුසු නොවන බව ද, අයවැයට විරුද්ධ වනවා නම් එසේ කළ යුත්තේ අයවැය ලේඛනයේ අඩුපාඩුවක් තිබේ නම් එය පෙන්වා දීමෙන් බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

2013 වර්ෂය තුළ විශාල සංවර්ධනයක් බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට සිදුකිරීමට තමන්ට අවස්ථාව ලැබුණු බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලද අතර, ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු සභාපතිතුමාටත්, ගරු අමාත්‍යතුමන්ලාටත්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පළ කරන බව සඳහන් කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

තම පියා මෙම සභාවේ කටයුතු කළ කාලයේ දී කිසිදු සංවර්ධනයක් මෙම සභා බල ප්‍රදේශයට සිදු නොකළ බවට පසුගිය මහා සභා රැස්වීමේ දී නගර සභා ගරු මන්ත්‍රී එම්.

ටී. එම්. රූමි මැතිතුමන් විසින් ප්‍රකාශ කළ බව නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, එම ප්‍රකාශය සාවද්‍ය බව සඳහන් කරන ලදී. තම පියා නගර සභාවේ සභාපතිවරයා වශයෙන් පත් වන විට සේවකයන්ට වැටුප් ගෙවීමට පවා මුදල් නොතිබූ තත්ත්වයක් තිබූ බවත්, තම පෞද්ගලික මුදලින් එම වැටුප් ගෙවීමට කටයුතු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

පැය කිහිපයක් ජල සැපයුම ලබා දී තිබූ බළන්ගොඩ නගරයට පැය 24 පුරා ජල සැපයුමක් ලබා දීමට එතුමන් කටයුතු කළ බවත්, නව නගර සැලසුම සාදා ඉදිරිපත් කරන ලද බවත්, එවන් සේවයක් කරන ලද නායකයකු සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් තම කණගාටුව පළ කරන බවත් සඳහන් කරන ලදී.

> *ඒ වන විට සභාවේ මුදලින් සභා ගොඩනැගිල්ල සාදා තිබූ බවත්, එබැවින් එවකට සිටි අඩු සේවක පිරිසට වැටුප් ගෙවීමට ඒ හේතුවෙන් නොහැකි වූ අතර, තම පෞද්ගලික මුදලින් එම වැටුප් ගෙවා පසුව එම මුදල් සභාවෙන් ලබා ගත් බවට අවශ්‍ය නම් වවුචර ඉදිරිපත් කළ හැකි බවත් එම ප්‍රකාශයට පිළිතුරු දෙමින්* ***ගරු සභාපතිතුමන්*** *විසින් සඳහන් කරන ලදී. එමෙන්ම නව නගර සංවර්ධනයට ණය ආධාර ලබා ගනිමින් එය ක්‍රියාත්මක කර අවසන් කරන ලද්දේ තම පාලනය යටතේ බවත් ගරු සභාපතිතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී. තමන් සහ ගරු උප සභාපතිතුමන් ආණ්ඩු පක්ෂයට වඩා එවකට ජනතාවට සේවාවක් සිදු කළ බව ද, රු. ලක්ෂ 20ක් වටිනා මාර්ග සෑදීමට හැකියාව ලැබුණු බව ද එතුමන් සිහිපත් කරන ලදී.*
>
> *'' අසංක විජයසිංහ මැතිතුමාගේ පියා පළාත් සභා ගරු මන්ත්‍රීවරයකු වශයෙන් ද, චමික වැවේගෙදර මැතිතුමන්ගේ පියා මෙම නගර සභාවේ සභාපතිවරයකු වශයෙන් ද කටයුතු කර තිබෙනවා. ඒ කාලය තුළ දී බළන්ගොඩ නාගරික ජනතාවට අවශ්‍ය සංවර්ධනය ලබා දීමට නොහැකි වීම නිසයි අද විපක්ෂයට පත් කර තිබෙන්නේ. '' යනුවෙන් පමණක් තමන් ප්‍රකාශ කළ බවත් කිසිදු සේවයක් සිදු නොකළ බවට එයින් අදහස් නොවන බවත්* ***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි*** *මැතිතුමන් විසින් ඉහත ප්‍රකාශයට පිළිතුරු වශයෙන් පසුගිය මහා සභා වාර්තාවෙන් උපුටා දක්වමින් සඳහන් කරන ලදී.*

### 14:02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් සිදු කරන ලද ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් තමන් ද කණගාටුවට පත් වන බව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් සඳහන් කරන ලදී. තම පියාගේ පාලන කාලයේ දී කිසිදු සේවාවක් නොකළ බවත්, එක්සත් ජාතික පක්ෂයෙන් කිසිදු සේවාවක් නොකළ බවත් ප්‍රකාශ කිරීම නුසුදුසු බවත්, කාලයේ හැටියට, රටේ තිබූ දියුණුව, තාක්ෂණයේ දියුණුව අනුව තම තම ශක්ති ප්‍රමාණයෙන් එතුමන් කටයුතු කළ බව එතුමන් සඳහන් කරන ලද අතර, සන්නිවේදනය සහ තාක්ෂණය දියුණු වර්තමාන කාලයේ වැඩි සංවර්ධනයක් සිදුවී ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

### 14:03 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

තමන් සහ සභාපතිතුමන් අතර මිත්‍රත්වය දීර්ඝ කාලීන බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් සිහිපත් කරන ලදී. අයවැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීමට අදහසක් නොතිබූ බවත්, සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයෙන් සිදු කරන ලද දැන්වීමට අනුව එසේ කිරීමට සිදුවූ බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. අයවැය ප්‍රතිපාදන වලින් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන තමන් වෙත ලබා දීම හෝ නොදීම සභාපතිතුමන් විසින් තීරණය කළ යුතු බව ද එතුමන් සඳහන් කරන ලදී.

දෙහිගස්තලාව ප්‍රදේශයෙන් තමන් තරග කරන බවත්, එම ප්‍රදේශයේ වැඩි මුස්ලිම් ජනතාව එක්සත් ජාතික පක්ෂයට ඡන්දය ප්‍රකාශ කරන බවත්, එතුමන් ප්‍රකාශ කරන ලදී. බළන්ගොඩ නගරයේ බොහෝ ඉඩකඩම් තම පවුලට අයත්ව තිබූ බව ද, හිටපු ගරු අමාත්‍ය

අබුසාලි මැතිතුමන් තමන්ගේ සීයා කෙනෙකු බව ද, තමන් හට අබුසාලි මැතිතුමන්ගෙන් ලැබුණු අවවාදයන්ට අනුව මෙතෙක් කාලයක දේශපාලනයට තමන් කිසිවකුගෙන් මුදල් ලබා ගෙන නොමැති බව ද, දේශපාලනයෙන් මුදල් උපයා නොගත් බව ද, එතුමන් පවසන ලදී. එබැවින් තමන් අවතක්සේරුවට ලක් නොකරන මෙන් ඉල්ලා සිටින ලදී. 2002 සිට 2006 දක්වා නගර සභාවේ තමන් මන්ත්‍රීවරයකු වශයෙන් සිටි බව ද, එකල පළාත් සභාව මෙන්ම මධ්‍යම ආණ්ඩුව ද වෙනත් පක්ෂයක පැවති බැවින් නගර සභාවේ කටයුතු සිදු කිරීමට අපහසුකාරී තත්ත්වයක් පැවති බව ද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා**

අද දින සභාවාරය උණුසුම්ව පැවති බව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා, තම දියණියගේ උත්සවයට පැමිණිම පිළිබඳව සියලු දෙනාට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

සභාවේ දී කෙතරම් වාද විවාද ඇති වුවත්, සියලුම දෙනා එසේ කරන්නේ තමන්ව මෙම ස්ථානයට පත් කරන ලද ජනතාවට සේවය කිරීමට බව ද, එසේ සේවය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දුන් සියලුම දෙනාට තම ස්තුතිය එල කරන ලද බව ද, සභා ධූර කාලය ඉතිරිව ඇති ඉදිරි වසරක කාලය තුළ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එක්ව ජනතාවට සේවයක් කිරීමට ආරාධනා කරන බව ද නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

හිටපු ගරු සභාපතිවරුන් වන ඒ විජයසිංහ මැතිතුමා මෙන්ම විමලසේන වැවේගෙදර මැතිතුමන් ඒ කාල වකවානුව තුළ තමන්ට කළ හැකි වූ ආකාරයට ප්‍රදේශයට සේවාවක් සිදු කරන ලද බව ද, ඒ. විජයසිංහ මැතිතුමන් මිහිඳු පෙරහැර තම පෞද්ගලික වියදමෙන් සිදු කරන ලද බව ද, නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් සිහිපත් කරන ලදී. මෙම සභාව නියෝජනය නොකරන එතුමන්ට පරිභව කිරීම නුසුදුසු බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ශ්‍රේෂ්ඨ නායකයකු බව ද, පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ට වැඩ කිරීමට හැකි පරිසරයක් එතුමන් විසින් නිර්මාණය කළ බව ද, එතුමන් ප්‍රකාශ කරන ලදී. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ සහයෝගයෙන් ඉදිරි ගමන යා යුතු බව ද එතුමන් විසින් ප්‍රකාශ කළ යුතු අතර, ඔවුන් හට වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන ගරු සභාපතිතුමන් විසින් ලබා දෙනු ඇති බවට විශ්වාසය පළ කරන ලදී.

**14:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

අද දින මහා සභා රැස්වීමේ දී තමන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වූයේ ඉරිදා පොළ සෙනසුරාදාට මාරු කිරීම සම්බන්ධව කතා කිරීමට බව ගරු උපසභාපතිතුමන් සඳහන් කරන ලදී. අනවශ්‍ය කරුණු සාකච්ඡා කිරීමට අද දින සභාවේ කාලය බොහෝ ගත වූ බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. තමන් විපක්ෂයේ සිටි කාලයේ එම කාර්යය හොඳින් ඉටු කළ බව ද, වර්තමාන විපක්ෂ කණ්ඩායමේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා ද තම කාර්යය හැකි පමණින් ඉටු කිරීම සම්බන්ධව තමන් සතුටට පත් වන බව ද, ජනතාවට සේවය කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කිරීම යහපත් බව ද, එයට තමන් විරුද්ධ නොවන බව ද, එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. එක්සත් ජාතික පක්ෂයට මුදල් ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධයෙන් තමන් මුල දී විරුද්ධ වූ බව ද, එම විරෝධය නොතකා ගරු සභාපතිතුමන් විසින් ඔවුන්ට ප්‍රතිපාදන ලබා දුන් බව ද, මෙවර සභාපතිතුමන් ඔවුන්ට ප්‍රතිපාදන ලබා නොදෙනවා යැයි ප්‍රකාශ කළත් ඔවුන්ට එම ප්‍රතිපාදන ලබා දෙන මෙන් තමන් ඉල්ලා සිටින බව ද ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී. මෙම සභාවේ සභාපතිවරයා වශයෙන් ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් තෝරා පත් කරගන්නා තාක් එතුමන්ට සහයෝගය ලබා දෙන බව ද, එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ලබන්නා වූ 2014 වර්ෂය සාමය හා සෞභාග්‍ය සපිරි නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. 1991 වර්ෂයේ දී තමන් නගර සභාවට තරග කරන විට සභාපති තනතුර බලාපොරොත්තු නොවූ බව ද, ඒ වන විට ව්‍යාපාරික අතින් තමන් ස්ථාවර තත්ත්වයක සිටි බව ද, එම කාලයේ සිට සිදු වූ සිදුවීම් පිළිබඳ කීමට තමන්ට හැකියාව ඇති බව ද, එතුමන් සඳහන් කරන ලදී. එකල මැතිවරණය සඳහා වර්තමාන පළාත් සභා ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය මැතිතුමන් දේශපාලනික දැනුමෙන් අඩුව සිටි තමන් හට උපකාර කළ බව ද ගරු සභාපතිතුමන් විසින් සිහිපත් කරන ලදී. පසුගිය කාලයේ කලින් කල හොඳ දේ මෙන්ම නරක දේ ද සිදු වූ බව ද, ඒ ගැන කථා කිරීමෙන් ඵලක් නොමැති බැවින්, ඉදිරියේ දී සිදු කළ හැකි සේවාවන් පිළිබඳ සංවාදයට ගැනීම අවශ්‍ය බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා කවර ප්‍රකාශයක් සිදු කළ ද දෙහිගස්තලාව ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ සහයෝගය තමන්ට ඇති බව ද, අවශ්‍ය නම් තමන් එම කොට්ඨාසය වෙනුවෙන් තරග කිරීමට වුව සූදානම් බව ද, මුස්ලිම් ජනතාව අවතක්සේරුවට ලක් කිරීම සුදුසු නොවන බව ද, ඔවුන් නගරයේ සංවර්ධනයට උරදෙන පිරිසක් බව ද, මුස්ලිම් ජනතාවට තමන් සිදු කළ උපකාරයන් ප්‍රමාණවත් නොවන බව ද, ඉදිරි වසර 10 කට හෝ මෙම ආණ්ඩුව හෝ පළාත් සභාව වෙනස් නොවන බැවින් තවත් සේවාවන් රැසක් ඉදිරියේ දී සිදු කළ හැකි වනු ඇති බවත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

මෙවර සභාවාරය සඳහා පැමිණි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය හා ජනමාධ්‍යවේදීන් ඇතුලු දෙනාට ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමන් ප.ව. 4.20ට පමණ මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.